# ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යංශය

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## (2017.01.01 – 2017.12.31 දක්වා)

# පටුන

පිටු අංක

i. ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය
ii. ලේකම් තුමාගේ පණිවුඩය
iii. පටුන
iv. දැක්ම හා මෙහෙවර

**I කොටස**

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| 1. | පසුබිම | 01 |
| 2. | කාර්යයන් හා කර්තව්‍යයන් | 02 |
| 3. | උපාය මාර්ග, වැඩසටහන් හා ක්‍රියාකාරකම් | 03 |
| 4. | 2017 කාර්ය සාධනය (2017.12.31 දිනට) | |
| | 4.1 මානව සම්පත් සංවර්ධනය | 04-06 |
| | 4.1.1 සේවක සංඛ්‍යා තොරතුරු | 04-05 |
| | 4.1.2 කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධන හා පුහුණු කිරීම | 06 |
| | 4.2 මූලධන ආයෝජන | 07 |
| | 4.2.1 වාර්ෂික ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය | 08 |
| | 4.2.2 ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන | 09 |
| | 4.2.3 ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 10 |
| | 4.2.4 විමධ්‍යගත මූලධන සංවර්ධන වැඩසටහන | 11 |
| | 4.3 අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය සැකසීම | 12 |
| | 4.4 ප්‍රාදේශීය සංවර්ධන ඒකක | |
| | 4.4.1 මධ්‍යම සංවර්ධන ඒකකය | 13 |
| | 4.4.2 නැගෙනහිර සංවර්ධන ඒකකය | 14 |

# II කොටස

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

දැක්ම/මෙහෙවර


1. හැඳින්වීම 15

2. පැවරී ඇති විෂයන් 16

3. 2017 වර්ෂයේ කාර්ය සාධනය

3.1 මානව සම්පත් සංවර්ධනය

3.1.1. සේවක සංඛ්‍යා තොරතුරු 17

3.2 මූලධන ආයෝජන

3.2.1 පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමනාකරණය 18

3.2.2 ගොවිපළින් බැහැර පාංශු සංරක්ෂණය හා ආපදා ජල කළමනාකරණය 19

3.2.3 පාංශු පෝෂක කළමනාකරණය 19

3.2.4. ඉඩම් ඵලදායීතාවය සහ භෝග විවිධාංගීකරණය 20

3. 2.5. ආයතනික සංවර්ධන කටයුතු 20

3.2.6 සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය 21

3.2.7 ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය 22-23



**ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය**

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක ප්‍රාදේශීය සංවර්ධනය යන විෂයය විශේෂයෙන් අවධානයට ලක් විය යුතු කරුණකි. ඒ නිසාම මේ රජය ඒ වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධනය සඳහා විවිධ වූ රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන මඟින් නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ ද ප්‍රාදේශීය සංවර්ධනයට අදාළ සපුරා ගත යුතු තවත් බොහෝ කාර්යයන් ක්ෂේත්‍රය තුළ හඳුනා ගැනීමට හැකි බව පෙනෙන්නට ඇත.ඒ නිසා ප්‍රාදේශීය විසමතාවන් අවම කර රටේ සමබර, තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා වඩාත් සාධනීයවූත් ඵලදායීවූත් ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම මගේ අමාත්‍යාංශයේ වගකීමක් වශයෙන් සලකමි.

අපේ රට නිදහස ලබාගත් දා පටන් විදේශීය ණය සහ ආධාර ලබා ගෙන නොයෙකුත් සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇතත් රටක් ලෙස තවමත් ප්‍රශස්ත සංවර්ධන මට්ටමක් ළඟා කරගැනීමට හැකියාව ලැබී නැත.

ජාතික අය වැය යෝජනාවේ දී එක් එක් අමාත්‍යාංශයට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය පමණක් සලකා මේ රට සංවර්ධනය කළ හැකි යැයි මම විශ්වාස නොකරමි. එබැවින් මේ රටට හැකි තරම් විදේශ ආයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම කාගේත් වගකීමක් යැයි සිතමි. ඒ හරහා සෑම ක්ෂේත්‍රයකම මහා පරිමාණ ආයෝජන ව්‍යාපෘති ආරම්භ කළ හැකිය. එමඟින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමටත් වාර්ෂිකව මෙරටින් පිටරටවලට ගලා යන විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත් ඉඩ සැලසෙනු ඇත.

මේ නිසා 2017 වර්ෂයේදී මාගේ අමාත්‍යාංශය මඟින් මෙරටට නව ආදායම් මාර්ග උත්පාදනය කළ හැකි මහා පරිමාණ ආයෝජන ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයන් කිහිපදෙනෙකුම හඳුනාගෙන ඔවුන් සමඟ මූලික සාකච්ඡා ආරම්භ කරන ලදී. ඇතැම් ව්‍යාපෘති අමාත්‍ය මණ්ඩල අනුමැතියටත් තවත් කිහිපයක් අදාළ පාර්ශවීය ආයතනවල අවධානය සඳහාත් යොමු කිරීමට කටයුතු කර ඇත.

2017 වර්ෂයේ මෙම අමාත්‍යාංශයට වෙන්වූ සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය අමාත්‍යාංශයේ අරමුණු සාධනය සඳහා ආයෝජන ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට හැකිවීම පිළිබඳ සතුටු වන අතර 2018 අයවැය මඟින් මේ වසරට සාපේක්ෂව 280%ක වැඩිවීමක් සහිතව මෙම අමාත්‍යාංශයට මූලධන ප්‍රතිපාදන වෙන් කර තිබීම අගය කරමි. එසේම ඒ මඟින් මේ වර්ෂයේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් වඩා පුළුල් ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවද සටහන් කරමි.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය

ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා (පා.ම.)



**අමාත්‍යාංශ ලේකම්ගේ පණිවුඩය**

"ප්‍රාදේශීය සංවර්ධනය" රටක සංවර්ධන ක්‍රියාවලියේ දී බහුලව හා නිරන්තර ව භාවිතා වන යෙදුමකි. එමගින් අර්ථ ගැන්වෙන්නේ "අඩු ආර්ථික සංවර්ධනයක් සහිත ප්‍රදේශ සඳහා සහාය ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග" යන්න යි. "ප්‍රාදේශීය" සීමාවන් එම සහාය ක්‍රියාමාර්ගයන්ගේ භාවිතයන් හා ඉලක්ක එකිනෙකට වෙනස් වේ. "ප්‍රාදේශීය සංවර්ධනය" යනු මේ අනුව ඉතා පුළුල් යෙදුමක් බව පෙනෙන්නට ඇතත් සරල අර්ථයෙන් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් එය "ප්‍රාදේශීය ව පවත්නා විසමතාවන් අවම කිරීම සඳහා රැකියා හා වත්කම් ජනනය කිරීම සඳහා ගනු ලබන පොදු උත්සාහයක්" වශයෙන් හඳුන්වනු ද දක්නට ලැබේ.

ප්‍රාදේශීය සංවර්ධන විෂය කේන්ද්‍ර කරමින් 2016 වසරේ දී ස්ථාපිත මෙම අමාත්‍යාංශය වෙත කාර්ය හා කර්තව්‍යයන් පැවරීමේදී ද ඉහත නිර්වචනයන් මගින් අර්ථ දක්වන ලද අරමුණු සපුරාලීම වෙනුවෙන් ස්ථාපනය කරනු ලබන බව අදාළ ගැසට් නිවේදනය මගින් පැහැදිළි ලෙස දක්වා ඇත.

2017 වර්ෂය තුළ අමාත්‍යාංශයට වෙන් වූ මූලධන ප්‍රතිපාදන මගින් එම අරමුණු සපුරා ගැනීම වෙනුවෙන් හඳුනා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට හැකිවීම පිළිබඳව සතුටු වෙමි.

ඌන සංවර්ධනයක් සහිත ප්‍රදේශවල ජනතාවගේ ජීවන තත්වය නංවාලීමත් ප්‍රදේශ අතර පවත්නා විසමතාවන් අවම කිරීමත් අතිගරු ජනාධිපතිතුමාගේ මහපෙන්වීම මත ක්‍රියාත්මක වන ජාතික ආහාර ප්‍රවර්ධන සංග්‍රාමයට සමගාමීව ජාතික ආහාර නිෂ්පාදන ප්‍රවර්ධන ක්‍රියාමාර්ග දිරිගැන්වීමත් සඳහා 2018 වර්ෂයේ දී පූර්ණ ලෙස අවධානය යොමු කිරීමට අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනිමින් සිටි. ඒ සඳහා 2017 ට සාපේක්ෂ ව 280% ක ප්‍රතිපාදන ජාතික අයවැය මගින් වෙන් කර තිබීම පිළිබඳව සතුටු වෙමි.

ඒ.පී.ජී. කිත්සිරි

ලේකම්

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

## දැක්ම

සමතුලිත තිරසාර ප්‍රාදේශීය සංවර්ධනයක් තුළින්
ජාතික ආර්ථික සංවර්ධනයට දායකත්වය

## මෙහෙවර

ප්‍රශස්ත අයුරින් සම්පත් භාවිතයෙන්,
ප්‍රාදේශීය විශේෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් ප්‍රජා ජීවන තත්වය නගා සිටුවීම, විරැකියාව හා ප්‍රාදේශීය විසමතාවන් අවම කිරීම.

# I කොටස

# ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

## 1. පසුබිම

ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළුව ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සුදුසු ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීමේ සහ ජාතික ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් අංක 1958/72 හා 2016.03.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් කැබිනට් අමාත්‍යාංශයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය (හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම) මෙම අමාත්‍යාංශයට අයත් වූ ව්‍යවස්ථාපිත ආයතනය වේ.

රටේ සමස්ත ජනතාව අතර ආර්ථික ප්‍රතිලාභ සමසේ බෙදී යාමට නම් සමබර ප්‍රාදේශීය සංවර්ධනයක් පැවතිය යුතුය. එහෙත් විවිධ උපාය මාර්ග යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩ සටහන් මඟින් රටේ සෑම ප්‍රදේශයකට ම එක සේ ප්‍රතිලාභ සමසේ බෙදී ගොස් ඇති බවක් දක්නට නැත. මේ නිසා ප්‍රදේශ අතර පවතින සංවර්ධන විසමතාවය වඩාත් කැපී පෙනේ.

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට බස්නාහිර පළාතේ දායකත්වය 39.7% ක් වන විට ඊළඟට වැඩි ම දායකත්වයක් සපයන වයඹ, දකුණ සහ මධ්‍යම පළාත්වල දායකත්වය 10%-11% ත් අතර පවතී. මේ අතර අඩු ම දායකත්වයක් සපයන උතුර,නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල එම අගය 4%-6% අතර ඉතා පහළ අගයක පවතී. ( මහ බැංකු වාර්තාව ) පළාත් අතර පවතින සංවර්ධන විෂමතාවයේ පරතරය මෙයින් මනාව පැහැදිළි වේ. මෙම සංවර්ධන විෂමතාවන් අවම කොට තිරසාර ජාතික සංවර්ධනයක් අත් කර ගැනීම අප හමුවේ ඇති අභියෝගය යි.

අඩු සංවර්ධන සහිත ප්‍රදේශ පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ආර්ථික හා සාමාජීය යටිතල පහසුකම් වර්ධනය කර රැකියා අවස්ථා ජනනය වන දේශීය හා විදේශීය ආයෝජනයන්ට අවකාශ සැලසීමටත් ග්‍රාමීය ප්‍රදේශවල විවිධ ජීවනෝපාය අවස්ථා ජනනය වන යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් අමාත්‍යාංශය පියවර ගනිමින් සිටී. එක් එක් ප්‍රදේශවල පවත්නා සම්පත් හා විභවතාවන් උපරිමව භාවිතා කිරීමට සලස්වා ඒවා ආශ්‍රිත ව නව ව්‍යවසායක අවකාශයන් විවර කිරීමට ද කටයුතු කරමින් සිටී.

## 2. කාර්යයන් හා කර්තව්‍යයන්

අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යයන් වශයෙන් ඇත්තේ ;

- ප්‍රාදේශීය සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළු ව ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සුදුසු ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් සම්බන්ධීකරණය කිරීම.
- මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, යන දිස්ත්‍රික්කවල විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා හදබිම (හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම) අධිකාරියට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන්, ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම, ඇගයීම හා එම ආයතනය අධීක්ෂණය කිරීම යන කරුණු ය.

මෙම කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේ දී ප්‍රදේශයේ ජනතාව අතර පවත්නා සමාජ හා ආර්ථික විසමතාවයන් අවම කිරීම ද අපේක්ෂිත ය. මෙම ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ විශේෂිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම අවශ්‍ය වේ. එහිදී, මධ්‍යම රජයේත්, පළාත් හා ප්‍රාදේශීය මට්ටම්වල රාජ්‍ය ආයතනවලත් සෙසු ආයතන සමගත් පුළුල් සම්බන්ධීකරණයකින් කටයුතු කරමින් සිටී.

## 3. උපාය මාර්ග, වැඩසටහන් හා ක්‍රියාකාරකම්

පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පහත වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම්වල යෙදෙනු ඇත.

(අ.) රේඛීය හා පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝජිතයන් රාජ්‍ය නිලධාරීන් නිදහස් විද්වත් කණ්ඩායම් සමඟ ප්‍රාදේශීය සංවර්ධන අවශ්‍යතා විමර්ශනය කිරීම.

(ආ.) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය හෝ දේශීය හා විදේශීය පෞද්ගලික ඍජු ආයෝජන අවකාශයන් ප්‍රවර්ධනය.

(ඇ.) ග්‍රාමීය ප්‍රජාවගේ සාමාජීය අවශ්‍යතාවන් සැලසීම.

(ඈ.) දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් කෘෂි සැකසුම් කර්මාන්ත සඳහා තාක්‍ෂණය සහ පහසුකම් සැලසීම.

(ඉ.) දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක ම පාහේ අඩු වැඩි වශයෙන් සිදුවන පාංශු ඛාදනය හා හායනය අවම කර පාංශු සංරක්‍ෂණයට හා පරිසර පද්ධතීන් ආරක්‍ෂා කිරීමට ප්‍රජාව යොමු කිරීම.

(ඊ.) ග්‍රාමීය හා ප්‍රාදේශීය විෂමතාවන් අවම කිරීම සඳහා සාමාජීය හා ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය.

(උ.) ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම හා විරැකියාව අවම කිරීමට කුඩා පරිමාණ ව්‍යවසාය / කර්මාන්ත ජනනය සඳහා පහසුකම් සැලසීම.

(ඌ.) දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණයක් සහිත ස්වභා සෞන්දර්යාත්මක හා පෞරාණික ස්ථාන කේන්ද්‍ර කොට පහසුකම් ඉහළ නංවා එම ප්‍රදේශ ආශ්‍රිත ජනතාව යොදාගෙන විවිධ අත්කම් නිෂ්පාදන, ආහාර, විනෝද ක්‍රියාකාරකම් හා පහසුකම් අලෙවියට යොමු කිරීම

# 4. 2017 කාර්යසාධනය (2017.12.31 දිනට)

## 4.1.මානව සම්පත් සංවර්ධනය

### 4.1.1 සේවක සංඛ්‍යා තොරතුරු

අංක 1958/72 දරණ ගැසට් පත්‍රය ප්‍රකාර ව මෙම අමාත්‍යාංශය වෙත පැවරුනු ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් හා විශේෂ ව්‍යාපෘතීන් සැලසුම් කරමින් ක්‍රියාත්මක කිරීම සඳහා සහ සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා 150 කින් සමන්විත පහත සඳහන් කාර්ය මණ්ඩලයක් අනුමත කරනු ලැබ ඇත.

අමාත්‍යාංශයේ කාර්ය ස්වභාවය සලකා බලා එම කාර්ය මණ්ඩලය අතුරින් තනතුරු 85 ක් ස්ථිර පදනමින් ද, ඉතිරි තනතුරු 66 කොන්ත්‍රාත් පදනමින් ද බඳවා ගැනීමට අනුමැතිය ලැබිණි. ඒ පිළිබඳ දත්තයන් පහත සටහන මඟින් ඉදිරිපත් කර ඇති අතර 2017.12.31 දිනට පුරප්පාඩුව පවතින තනතුරු පිළිබඳව ඒ ඒ තනතුරු ඉදිරියෙන් දක්වා ඇත.

| අනු අංකය | තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | | 2017.12.31 දිනට පුරප්පාඩු කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | ස්ථිර | කොන්ත්‍රාත් |
| 1 | ලේකම් | 1 | | | |
| 2 | අතිරේක ලේකම් ශ්‍රී.ලං.ප.සේ. | 2 | | | |
| 3 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී.ලං.ප.සේ. | 1 | | 1 | |
| 4 | අධ්‍යක්ෂ(සංවර්ධන) ශ්‍රී.ලං.ප.සේ. | 1 | | | |
| 5 | අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී.ලං.ක්‍ර.සේ. | 2 | | 1 | |
| 6 | ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී.ලං.ග.සේ | 1 | | | |
| 7 | අධ්‍යක්ෂ (සංවර්ධන ඒකක) | | 2 | | |
| 8 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. | 1 | | 1 | |
| 9 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ. | 2 | | | |
| 10 | සහකාර අධ්‍යක්ෂ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන ඒකක) | | 8 | | 6 |
| 11 | සහකාර ලේකම් ශ්‍රී.ලං.ප.සේ. | 1 | | 1 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | සහකාර ලේකම් කම්කරු සබඳතා ශ්‍රී.ලං.ප.සේ.නොවන | 1 | | | |
| 13 | ගණකාධිකාරී ශ්‍රී.ලං.ග.සේ. | 1 | | 1 | |
| 14 | අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ. | 1 | | 1 | |
| 15 | නීති නිලධාරී (තාවකාලික) | 1 | | 1 | |
| 16 | පරිපාලන නිලධාරී රා.ක.ස.සේ.(අධි පන්තිය) | 1 | | | |
| 17 | තොරතුරු හා තාක්ෂණ නිලධාරී | 1 | | | |
| 18 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | 1 | | | |
| 19 | සංවර්ධන නිලධාරී | 20 | 24 | 16 | 3 |
| 20 | තොරතුරු හා තාක්ෂණ සහකාර | 1 | | 1 | |
| 21 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | | 3 | |
| 22 | කළමනාකරණ සහකාර | | 12 | | 2 |
| 23 | රියදුරු | 12 | 12 | 1 | 7 |
| 24 | වීඩියෝ කැමරා ශිල්පී | 1 | | 1 | |
| 25 | කැමරා ශිල්පී | 1 | | 1 | |
| 26 | වීඩියෝ කැමරා ශිල්පී (සහායක) | 1 | | 1 | |
| 27 | කාර්යාල කාර්ය සහායක | 10 | 8 | 1 | |
| එකතුව | | **85** | **66** | **32** | **18** |

*වගු අංක - 01*

### 4.1.2. කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධන සහ පුහුණු කිරීම

අමාත්‍යාංශ නිලධාරීන් අතර බහුතරය ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත වූ නවක නිලධාරීන් බැවින් රාජ්‍ය සේවය පිළිබඳ දැනුම හා නිපුණතා සංවර්ධන පුහුණු සැසි කිහිපයක් පවත්වන ලදි. තවද, මාණ්ඩලික නිලධාරීන් වෙනුවෙන් දැනුම කුසලතා වර්ධනය සඳහාත්, කාර්යක්ෂමතාව ඉහළ මට්ටමකට ගෙන ඒමටත් පුහුණු වැඩසටහන් පැවැත් විය.

**අභ්‍යන්තර පුහුණු පිළිබඳ වාර්තාව**

| පුහුණු සැසි මාතෘකා | පුහුණුව සඳහා සහභාගී වූ කණ්ඩායම් |
|---|---|
| කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම | i. අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්<br>i. ශ්‍රී ලංකා හඳුනාගැනීම අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන් |
| • කාර්යාල ක්‍රම<br>• ගිණුම් අංශයේ කටයුතු හා මුදල් රෙගුලාසි<br>• විශ්‍රාම වැටුප් හා පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගැනීම<br>• කාර්යාල ක්‍රම හා ලිපි කටයුතු<br>• ප්‍රසම්පාදන කටයුතු | i. සංවර්ධන නිලධාරීන්<br>ii. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් |
| • රාජ්‍ය සේවයේ අචාර ධර්ම හා වටිනාකම්<br>• විනය හා හැසිරීම් | i. සංවර්ධන නිලධාරීන්<br>ii. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්<br>iii. කාර්යාල කාර්ය සහායක<br>iv. රියදුරන් |
| • කාර්ය මණ්ඩල අභිප්‍රේරණ බැහැරගත පුහුණු වැඩසටහන - අනුරාධපුර කලා වැව | i. අමාත්‍යාංශයේ සියළු නිලධාරීන් |

*වගු අංක - 02*

**විදේශ පුහුණු පිළිබඳ වාර්තාව**

| පුහුණු පාඨමාලාව | රට | කාල පරිච්ඡේදය | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය පිළිබඳ සමුළුව - 2017 | චීනය | 2017.04.03-2017.04.23 | 01 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල මූල්‍ය සේවා සහ සහයෝගීතාවය පිළිබඳ සමුළුව - 2017 | චීනය | 2017.06.02-2017.06.22 | 01 |
| ග්‍රාමීය ප්‍රදේශ වල කාන්තාවන් මඟින් අඩු ආදායම්ලාභී පවුල් ශක්තිමත් කිරීම සඳහා වන වැඩමුළුව | දකුණු කොරියාව | 2017.06.23-2017.07.13 | 01 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල චර්යාත්මක හා ආර්ථික,පාරිසරික ගොඩනැගීම පිළිබඳ සමුළුව - 2017 | චීනය | 2017.08.30-2017.09.21 | 01 |

*වගු අංක - 03*

## 4.2. 2017 මූලධන ආයෝජන

2017 වර්ෂයේ අමාත්‍යාංශයට ජාතික අයවැය මඟින් වෙන් වූ සම්පූර්ණ ප්‍රතිපාදන මුදල රු.මිලියන 658.426කි. එයින් රු.මි.277.0ක් මූලධන ප්‍රතිපාදන වේ. ඉතිරිය පුනරාවර්තන වියදම් සඳහා ය. මූලධන ප්‍රතිපාදන පහත සඳහන් පරිදි වෙන් වී තිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| i. | යටිතල පහසුකම් සංවර්ධනය | - | රු.මි. | 50.0 |
| ii. | ප්‍රාදේශීය සංවර්ධනය | - | රු.මි. | 100.0 |
| iii. | හදබිම අධිකාරිය | - | රු.මි. | 100.0 |
| iv. | වෙනත් මූලධන වියදම් | - | රු.මි. | 27.0 |
| | | | රු.මි | 277.0 |

අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන්ට හා කර්තව්‍යයන්ට අනුගත ව සකස් කරන ලද 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් යෝජිත ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාකාරකම් දෙවන කාර්තුව අවසානයට පැවති ප්‍රගතිය සමාලෝචනයෙන් අනතුරුව අවශ්‍ය පරිදි සංශෝධනය කරන ලදී. ඒ අනුව පහත සඳහන් වැඩසටහන් හා ව්‍යාපෘති යටතේ ප්‍රවර්තන වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

01. ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන — රු. මි. 50.0
    - සමාජ හා සංස්කෘතික සංවර්ධනය
    - යටිතල පහසුකම් සංවර්ධනය
    - ජීවනෝපාය සංවර්ධනය
    - ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම සම්පාදනය

02. ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන - රු. මි. 100.0

03. වෙනත් මූලධන වියදම් — රු. මි. 27.0
    - මූලධන වත්කම් නඩත්තු හා ප්‍රතිසංස්කරණ
    - මූලධන වත්කම් අත්පත් කර ගැනීම
    - ධාරිතා සංවර්ධනය

## 4.2.1. වාර්ෂික ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය

| | වැඩසටහන | 2017 සඳහා වෙන් වූ ප්‍රතිපාදන (රු.මි) | 2017.12.31 දිනට වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| පුනරාවර්තන | අමාත්‍ය කාර්යාලය | 22,850,000.00 | 18,140,957.00 | 79.39 |
| | පරිපාලන කටයුතු | 201,761,000.00 | 177,407,715.00 | 87.93 |
| | ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් | 36,430,000.00 | 17,214,954.00 | 47.26 |
| | යටිතල පහසුකම් සංවර්ධනය | - | - | - |
| | හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් | 79,000,000.00 | 70,035,000.00 | 88.66 |
| | **උප එකතුව** | **340,041,000.00** | **282,798,626.00** | **83.17** |
| ප්‍රාග්ධන | අමාත්‍ය කාර්යාලය | 40,225,000.00 | 24,439,304.00 | 60.76 |
| | පරිපාලන කටයුතු | 28,200,000.00 | 15,347,377.00 | 54.42 |
| | ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් | 100,000,000.00 | 24,130,178.00 | 24.13 |
| | යටිතල පහසුකම් සංවර්ධනය | 50,000,000.00 | 27,640,443.00 | 55.28 |
| | හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් | 100,000,000.00 | 61,802,849.00 | 61.80 |
| | **උප එකතුව** | **318,425,000.00** | **153,360,151.00** | **48.16** |
| මුළු එකතුව | | **658,466,000.00** | **436,158,777.00** | **66.24** |

*වගු අංක - 04*

### මූල්‍ය ප්‍රතිපාදන හා ප්‍රගතිය



### 4.2.2. ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන

| අනු අංකය | අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන (රු.) | භෞතික ප්‍රගතිය (%) | සත්‍ය වියදම (රු.) | අතැති බිල්පත් වටිනාකම (රු.) | අවිච්ඡේද ව්‍යාපෘති සංඛ්‍යාව | අවිච්ඡේද වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | මාර්ග | 40 | 49,083,663.60 | 77 | 15,811,135.61 | 21,859,518.26 | 7 | 3,938,576.54 |
| 2 | කාණු/පාලම්/ බෝක්කු | 6 | 6,890,000.00 | 78 | - | 5,117,805.67 | 2 | 1,336,227.80 |
| 3 | ප්‍රජා ශාලා | 3 | 14,999,969.15 | 41 | - | 5,641,195.26 | 3 | 6,601,743.87 |
| 4 | අමුණු / වැව් | 1 | 6,700,000.00 | - | - | - | - | - |
| 5 | ආගමික ස්ථාන ඉදිකිරීම් | 3 | 9,000,000.00 | 85 | 3,902,605.99 | 3,496,502.21 | 2 | 1,406,090.76 |
| 6 | ජල යෝජනා ක්‍රම | 2 | 8,000,000.00 | 76 | 4,000,000.00 | 1,878,924.16 | 1 | 1,646,181.62 |
| 7 | ආදාහනාගාර | 1 | 5,000,000.00 | 99 | - | 4,816,133.07 | - | - |
| 8 | පාසල් ආශ්‍රිත ඉදිකිරීම් | 1 | 195,736.40 | 100 | 195,736.40 | - | - | - |
| පරිපාලන වියදම(කැලණිය) | | | | | 20,700.00 | 772,023.31 | | 331,610.45 |
| දිස්ත්‍රික් ලේකම් පරිපාලන වියදම(ගම්පහ) | | | | | 200,000.00 | | | - |
| එකතුව | | **57** | **99,869,369.15** | **70** | **24,130,178.00** | **43,582,101.94** | **15** | **15,260,431.04** |

*වගු අංක - 05*

**එදා...** **අද**





ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ මායා මාවතේ අතුරු මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම

එදා...                                                    අද





ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ වනවාසල සේපාලිකා වත්ත පාර කොන්ක්‍රීට් කිරීම

## 4.2.3. ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන

| අනු අංකය | අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන (රු.) | භෞතික ප්‍රගතිය (%) | සත්‍ය වියදම (රු.) | අතැති බිල්පත් වටිනාකම (රු.) | අවිච්ඡේද ව්‍යාපෘති සංඛ්‍යාව | අවිච්ඡේද වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | මාර්ග | 46 | 27,849,273.80 | 82 | 11,115,339.25 | 10,802,107.34 | 7 | 3,514,463.94 |
| 2 | කාණු/පාලම්/ බෝක්කු | 3 | 2,160,000.00 | 81 | 844,320.95 | 735,222.12 | - | - |
| 3 | වෙනත් | 1 | 528,000.00 | 98 | 511,310.54 | | | |
| 4 | ප්‍රජා ශාලා | - | - | - | - | - | - | - |
| 5 | අමුණු / වැව් | - | - | - | - | - | - | - |
| 6 | ආගමික ස්ථාන ඉදිකිරීම් | 9 | 6,500,000.00 | 99 | 5,003,282.00 | - | - | - |
| 7 | ජල යෝජනා | - | - | - | - | - | - | - |
| 8 | ආදාහනාගාර | - | - | - | - | - | - | - |
| 9 | රෝහල් | 1 | 300,000.00 | 99 | 291,240.00 | - | - | - |
| 10 | පාසල් | 2 | 472,350.00 | 100 | 220,000.00 | 252,350.00 | - | - |
| 11 | සමාජ හා සංස්කෘතික සංවර්ධන වැඩසටහන | 54 | 5,766,350.00 | 82 | 4,963,719.79 | - | - | - |
| 12 | ප්‍රාදේශීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 99 | 5,424,026.20 | 75 | 3,691,230.47 | - | - | - |
| 13 | ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් | 1 | 1,000,000.00 | 99 | 1,000,000.00 | | | |
| එකතුව | | **216** | **50,000,000.00** | **83** | **27,640,443.00** | **11,789,679.46** | **7** | **3,514,463.94** |

*වගු අංක - 06*

### 4.2.4. විමධ්‍යගත මූලධන අයවැය සංවර්ධන වැඩසටහන

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන විමධ්‍යගත මූලධන අයවැය සංවර්ධන වැඩසටහනේ උතුරු මැද, මධ්‍යම, නැගෙනහිර හා ඌවට අයත් දිස්ත්‍රික්ක 09ක පාර්ලිමේන්තු ගරු මන්ත්‍රීවරුන් 63ක් සඳහා වෙන් වෙන රු.මි. 630.0 ක ව්‍යාපෘති යෝජනා චක්‍රලේඛ ප්‍රකාර ව සමාලෝචනය කර අනුමත කර ප්‍රතිපාදන නිදහස් කිරීමේ නිර්දේශ ලබා දීම ද මෙම අමාත්‍යාංශයට පැවරිණි.

ඒ අනුව අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, බදුල්ල, නුවර එළිය, මහනුවර,මාතලේ දිස්ත්‍රික්කයන්ට අයත් මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘති යෝජනා 5957ක් අනුමත කරන ලද අතර රු. මි.629.45 ක ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා නිර්දේශ කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | මන්ත්‍රී සංඛ්‍යාව | අනුමත ප්‍රතිපාදන (රු.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | අම්පාර | 7 | 69,910,000.00 | 567 |
| 02. | අනුරාධපුර | 9 | 90,000,000.00 | 1209 |
| 03. | බදුල්ල | 8 | 80,000,000.00 | 543 |
| 04. | මඩකළපුව | 5 | 50,000,000.00 | 418 |
| 05. | මහනුවර | 12 | 119,538,000.00 | 1317 |
| 06. | මාතලේ | 5 | 50,000,000.00 | 709 |
| 07. | නුවරඑළිය | 8 | 80,000,000.00 | 546 |
| 08. | පොළොන්නරුව | 5 | 50,000,000.00 | 453 |
| 09. | ත්‍රිකුණාමලය | 4 | 40,000,000.00 | 268 |
| **එකතුව** | | **63** | **629,448,000.00** | **5957** |

*වගු අංක - 07*

## 4.3 අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය ආරම්භ කිරීම

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය විවෘත කිරීම 2017 ඔක්තෝබර් මස 02 වන දින සිදු කෙරුණි. මේ ඔස්සේ වර්තමානයේ රජය මඟින් බලාත්මක කර ඇති තොරතුරු දැන ගැනීමේ පනත ට අනුගත වෙමින් මෙහි කටයුතු සිදු කරන අතර අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන කටයුතු මහජනතාව අතරට ගෙන යාමත්, නව ආයෝජන අවස්ථා සහ පහසුකම් ආදිය පිළිබඳව දැනුවත් කිරීමත්, විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ අමාත්‍යාංශය මඟින් ආරම්භ කරනු ලබන විවිධ ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීමත් සිදු කරනු ලබයි.

**( www.mrd.gov.lk ඔස්සේ මෙම නිල වෙබ් අඩවියට පිවිසිය හැකිය.)**






## 4.4 ප්‍රාදේශීය සංවර්ධන ඒකක

දිවයිනේ ප්‍රධාන දිස්ත්‍රික්ක 09ක් එනම් මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, යන දිස්ත්‍රික්කයන්හි ජාතික ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගත් විශේෂිත සංවර්ධන ආයෝජන ව්‍යාපෘති සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම අරභයා ප්‍රාදේශීය සංවර්ධන ඒකක දෙකක් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/1132/754/002 මඟින් ස්ථාපිත කර ඇත.

**ප්‍රාදේශීය සංවර්ධන ඒකක මඟින් සපිරෙන සේවා**

- මහාපරිමාණ සංවර්ධන ආයෝජන ව්‍යාපෘති සඳහා ඉදිරිපත් වන දේශීය හා විදේශීය ආයෝජකයන්ට අවශ්‍ය පහසුකම් සැලසීම.
- අදාල ආයතනවලින් පහතින් දැක්වෙන සේවාවන් ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීම.
  - සුදුසු භූමියක් තෝරාගැනීම.
  - පිවිසුම් මාර්ග පහසුකම් වැඩි දියුණු කිරිම.
  - පාරිසරික අනුමැතීන් ලබා ගැනීම.
  - ඉදිකිරීම් අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දී අවශ්‍ය අවසරයන් ගැනීම.
  - විදුලිය, ජලය සහ දුරකතන පහසුකම් ලබා ගැනීම.
  - සමාගම්/වෙළඳ ලියාපදිංචි කිරීම භූවිද්‍යා හා කැනීම් ආයතන මඟින් අනුමැතීන් ලබා ගැනීම.
- මානව සම්පත් සපුරා ගැනීම සහ පුහුණු කිරීම.
- ඉදි කිරීම් සහ අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

### 4.4.1 මධ්‍යම සංවර්ධන ඒකකය

මධ්‍යම සංවර්ධන ඒකකය විසින් මහනුවර, මාතලේ, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ආයෝජන ව්‍යාපෘතීන් කිහිපයක් සම්බන්ධීකරණය සඳහා උත්සාහ ගෙන ඇත. සුළං බලශක්තිය ජනනය, පාරසරික සංචාරක කර්මාන්ත සහ කෘෂි කාර්මික යන ක්ෂේත්‍රවල ව්‍යාපෘතීන් කිහිපයක් සැලසුම් කරන ලදී. ආයෝජන මූල්‍ය ප්‍රාග්ධනය සැලසුම් කළ පරිදි ප්‍රමාණවත් මට්ටමක නොතිබීම සහ පාරසරික යෝග්‍යතාවය යන විවිධ ගැටලු මත එම යෝජිත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක මට්ටමට තවම පැමිණ නොමැත.

මේ වන විට මධ්‍යම සංවර්ධන ඒකකය මඟින් විදේශ ආයෝජකයකු සමඟ එක්ව බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රදේශයේ ඇමරිකානු ඩොලර් මිලියන 25කට වඩා වැඩි ආයෝජන වටිනාකමක් ඇති පාරසරික සංචාරක ආයෝජන ව්‍යාපෘතියක් සැලසුම් කරමින් සිටියි. යෝජිත ආයෝජනය මඟින් ප්‍රදේශයේ රැකියා ජනනය සඳහා මහත් පිටුවහලක් වනු ඇතැයි පුරෝකතනය කළ හැක.

## 4.4.2 නැගෙනහිර සංවර්ධන ඒකකය

අනුරාධපුරය , පොළොන්නරුව , ත්‍රිකුණාමලය ,මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නැගෙනහිර සංවර්ධන ඒකකය ක්‍රියාත්මක වේ.



ඇමරිකානු ඩොලර් මිලියන 100ක විදේශ ආයෝජනයකින් යුතුව හෝටල් ,වෙළඳ මධ්‍යස්ථාන සහ පරිපාලන ගොඩනැඟිලි වලින් සමන්විත වූ සමුද්‍රිය පන්තියේ (Ocean Class) නිකේතන වරායක් (Yacht Marina) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට යෝජිත අතර එහි ඉදිකිරීම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මේ වන විට සිදු කරනු ලැබේ.

මෙම නිකේතන වරාය ව්‍යාපෘතිය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර එහි ඉදිරි කටයුතු සම්පාදනය වෙමින් පවතී.

මෙමඟින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය විශාල වශයෙන් උපයා ගැනීමට හැකිවන අතර ඍජු හා වක්‍ර රැකියා අවස්ථාවන් 2000ක් පමණ උත්පාදනය කිරීමට අපේක්ෂිත වේ. සංචාරක ක්ෂේත්‍රයේ මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සංවර්ධනය වීමට ද මෙම ව්‍යාපෘතිය ඍජු බලපෑමක් සිදුකරනු ඇත.

තව ද මඩකලපුව දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් ඩොලර් මිලියන 297 ක ආයෝජනයකින් යුතුව සීනි කර්මාන්ත ශාලාවක්, එයට අනුබද්ධ කිරිගව ව්‍යාපෘතියක් සහ කාබනික පොහොර (කොම්පොස්ට්) ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් වී ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් ඍජු රැකියා අවස්ථා 625ක් ද වක්‍ර රැකියා අවස්ථා 1600ක් පමණ ද ජනනය වන බව පෙන්වා දී ඇත. මේ සබැඳිව පළමු සාකච්ඡා වටය පැවැත් වූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.



සීනි කර්මාන්ත ශාලාවක දර්ශනයක්

# II කොටස

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

**දැක්ම**

**"ගුණාත්මක කෘෂි නිෂ්පාදනයක් උදෙසා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනයේ ප්‍රමුඛයා වීම."**

**මෙහෙවර**

**"තිරසාර ස්වාභාවික සම්පත් සංරක්ෂණය සහ කෘෂි ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය තුළින් දේශීය ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම**

## 1. හැඳින්වීම

යටත් විජිත සමය තුළ ශ්‍රී ලංකාවේ සංවේදී පරිසර කලාප සහිත මධ්‍යම කඳුකරය ආශ්‍රිතව සිදුවූ වැවිලි භෝග වගාව හේතුවෙන් එම ප්‍රදේශයේ වන ආවරණය අවම විය. මෙය එම ප්‍රදේශයේ පරිසර සමතුලිතතාවය බිඳ වැටීමට හේතු විය. පසු කාලීනව මෙම ඉඩම් පද්ධති නිසි නඩත්තුවක් නොමැති වීම හේතුවෙන් දැඩි පාංශු ඛාදන තත්වයට පත්ව ඇත. එය එම ප්‍රදේශයේ මෙන්ම ජාතික වශයෙන් ද පාරිසරික ගැටලු රාශියකට හේතු වී ඇත. මෙම තත්වය අවම කිරීම සඳහා රජය මැදිහත්ව 1972 අංක 11 දරණ කෘෂිකර්ම නීති ගත සංස්ථා පනතට අනුව 1978 ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය හෙවත් (නැඩ්සා) ආයතනය ස්ථාපිත කර ඇත.

පසුව 1991 වර්ෂයේ අංක 678/15 දරණ විශේෂ ගැසට් නිවේදනය අනුව අධිකාරියේ නිල නාමය ශ්‍රී ලංකා හදබිම (හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම) අධිකාරිය ලෙස සංශෝධනයට ලක්කොට ඇත. 2016 වර්ෂයේ මාර්තු මාසයේ සිට එතෙක් කෘෂිකර්ම අමාත්‍යාංශ විෂය පථයට අයත් වූ මෙම ආයතනය ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කරණු ලැබිණි. ඉන් අනතුරුව 2017.07.07 වන දිනැති අංක 2026/45 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මූලික ගැසට් නිවේදනය සංශෝධනයට ලක් කරන ලද අතර ඒ මඟින් නව සංවර්ධන උපායමාර්ග හඳුනා ගැනීමටත් අධිකාරියේ ව්‍යාපෘති බල ප්‍රදේශය දිවයින ම ආවරණය වන පරිදි පුළුල් කිරීමටත් කටයුතු කර ඇත.

## 2. පැවරී ඇති විෂයයන්

කෘෂිකර්ම විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධනය සහ පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණ හා සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

1. පරිසරය රැක ගැනීම, ඉඩම් හා ජල සම්පත් සංරක්ෂණය හා ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ කාර්යයන් කළමනාකරණය කිරීම.
2. කෘෂි නිෂ්පාදන සැකසීම හා අලෙවිකරණය සඳහා මැදිහත් වීම.
3. වාණිජ කෘෂිකර්මාන්ත හා කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා අවශ්‍ය සහාය ලබා දීම.
4. කෘෂිකර්මාන්තය පදනම් කර ගත් ආයෝජන ඇති කිරීම සඳහා සැලසුම් සකස් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සේවාවන් සැපයීම හා විශේෂඥ දැනුම ලබා දීම.

2017 සංවර්ධන වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි. 100 ක් ද පුනරාවර්තන වියදම් ලෙස රු.මි.79 ක් ද මහ භාණ්ඩාගාරය මඟින් වෙන් කරන ලද අතර 2017.12.31 දින වන විට රු.මි.55.60ක් වැය කොට පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර මෙම දිනට පුනරාවර්තන වියදම් ලෙස වෙන් කරන ලද රු.මි.79 ක මුදලින් රු.මි. 70.93 ක මුදලක් වැය කර අධිකාරියේ මෙහෙයුම් හා ආයතනික කටයුතු සිදු කර ඇත.

# 3. 2017 කාර්ය සාධනය (2017.12.31 දිනට)

## 3.1.මානව සම්පත් සංවර්ධනය

### 3.1.1.සේවක සංඛ්‍යා තොරතුරු

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | විධායක අධ්‍යක්ෂ | 1 | 1 | |
| 02 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 1 | | 1 |
| 03 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 | 1 | - |
| 04 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | 1 | 1 | - |
| 05 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි) | 1 | 1 | - |
| 06 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා සැළසුම්) | 1 | 1 | - |
| 07 | පරිපාලන නිලධාරි | 1 | 1 | - |
| 08 | මූල්‍ය නිලධාරි | 1 | 1 | |
| 09 | අලෙවි නිලධාරි | 1 | | 1 |
| 10 | කෘෂිකර්ම සංවර්ධන නිලධාරි | 2 | 1 | 1 |
| 11 | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | 1 | - |
| 12 | කලාප නිලධාරි | 12 | 11 | 1 |
| 13 | කාර්මික නිලධාරි | 1 | - | 1 |
| 14 | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 35 | 32 | 3 |
| 15 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) | 19 | 18 | 1 |
| 16 | සරප් | 1 | 1 | - |
| 17 | යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 1 | 1 |
| 18 | ශ්‍රව්‍ය දෘෂ්‍ය සහායක | 1 | 1 | - |
| 19 | කාර්මික සහායක | 2 | - | 2 |
| 20 | රියදුරු | 14 | 12 | 2 |
| 21 | කාර්යාල කාර්ය සහායක | 4 | 4 | - |
| 22 | රිය සහායක | 3 | 2 | 1 |
| 23 | මුරකරු | 4 | 4 | - |
| 24 | කම්කරු | 2 | 2 | - |
| 25 | ගොවිපල් කම්කරුවන් (පල්ලේකැලේ හා කොත්මලේ) | 13 | 13 | - |
| | එකතුව | 125 | 110 | 15 |

*වගු අංක - 08*

*2014/25 චක්‍ර ලේඛය අනුව ස්ථිර කරන ලද පල්ලේකැලේ හා කොත්මලේ ගොවිපල් කම්කරුවන් 13 දෙනෙකු සඳහා ඔවුන්ට පෞද්ගලික වන සේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/1578/VII හා 2016-05-03 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇත.ඒ අනුව පත්වීම් පිරිනමා ඇත.

## 3.2. මූලධන ආයෝජන

### 3.2.1. පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමනාකරණය

ඉලක්කගත සංවර්ධන ප්‍රදේශ තුළ පාංශු ඛාදන තත්වයන් අවම කර ගනිමින් එම කලාපයේ ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීමත්, ගොවි ප්‍රජාවගේ ආර්ථික වර්ධනයත් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ ක්‍රියාකාරකම් ලෙස,

- මූලික සංරක්ෂණ සැලසුම්කරණය,
- නායකත්ව සංවර්ධනය තාක්ෂණික පුහුණු
- පාංශු සංරක්ෂණ ආදර්ශණ ස්ථාපිත කිරීම
- ජල මූලාශ්‍ර හා දියකඳුරු සංරක්ෂණය
- සොහා සිසුණැන පවුර පාසල් පරිසර සංරක්ෂණ වැඩසටහන
- පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර එහි කාර්ය සාධනය පහත දැක්වේ



ජල මූලාශ්‍ර හා දියකඳුරු සංරක්ෂණය



සොහා සිසුණැන පවුර පාසල් පරිසර





පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම

### 3.2.2. ගොවිපළින් බැහැර පාංශු සංරක්ෂණය හා ආපදා ජල කළමනාකරණය

ජනගහන ඝනත්වය ඉතා ඉහළ තලයක පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල මානව හා විවිධ දේශගුණික හේතූන් මත විනාශයට පත්ව ඇති ගොවිපළවලින් බැහැර අපවහන ජල ප්‍රවාහන පද්ධති නැවත පිළිසකර කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.





ගොවිපළින් බැහැර පාංශු සංරක්ෂණය හා ආපදා ජල කළමනාකරණය - ස්ථාපිත කිරිමට තෝරා ගත් ස්ථාන - කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

### 3.2 .3. පාංශු පෝෂක කළමනාකරණය

පාංශු ඛාදනයට හා පාංශු හායනයට ලක් වූ ඉඩම් තුළ පස නැවත පුනරුත්තාපනය කිරීම සඳහා කාබනික පොහොර නිෂ්පාදනයට හා භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර මේ යටතේ කාබනික ගොවිපල ආදර්ශන 100ක් ස්ථාපිත කිරීමට කටයුතු ඇත.





කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන

### 3.2.4. ඉඩම් ඵලදායිතාවය සහ භෝග විවිධාංගීකරණය

පාංශු ඛාදනය හා පාංශු භායනය හේතුවෙන් විනාශ වූ ඉඩම් පද්ධති සංරක්ෂණය කිරීමෙන් අනතුරුව එම ඉඩම් සඳහා සුදුසු භෝග රටාවක් හඳුන්වා දීමට කටයුතු කර ඇත. ඒ අනුව ගොවීන් සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කර ඇත.





බෝග වගා වැඩසටහන - විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

### 3.2.5. ආයතනික සංවර්ධන කටයුතු

ඉහත සඳහන් කළ සියළු ම සංවර්ධන ක්‍රියාකාරකම් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ආයතනය තුළ මානව හා භෞතික සම්පත් සංවර්ධනය කළ යුතුය. ඒ අනුව මෙම ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ 2017 වර්ෂය තුළ මානව සම්පත් සංවර්ධනය, භෞතික සම්පත් සංවර්ධනය, මාධ්‍ය හා ප්‍රචාරක ප්‍රවර්ධනය, ආයතනික සංවර්ධන සැලසුම්කරණය, ප්‍රගති සමාලෝචනය, විෂයානුබද්ධ උපදේශන සේවා ලබා ගැනීම වැනි ක්‍රියාකාරකම් සැලසුම්කරණ ලද අතර ඒ සඳහා 2017 සංවර්ධන වර්ෂය තුළ වෙන් කරන ලද මුදල රු.මි.4.0ක් වන අතර 2017.12.31 වන දිනට එහි මූල්‍යමය ප්‍රගතිය රු.මි.3.73 කි. එය ප්‍රතිශතයක් ලෙස 93% කි.

### 3.2.6. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | ඒකකය | ඉලක්කය | | භෞතික ප්‍රගතිය (%) | සත්‍ය වියදම (රු.) | අතැති බිල්පත් වටිනාකම (රු.) | අවිච්ඡේද වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍ය | | | | |
| 1 | පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමනාකරණය | ව්‍යාපෘති | 7 | 62.4 | 74% | 46,433,755.43 | 11,440,707.00 | |
| 2 | ගොවිපළින් බැහැර පාංශු සංරක්ෂණය හා අපවහන ජල කළමනාකරණය | නිර්මිතයන් | 27 | 27.5 | 18% | 5,264,281.77 | 10,116,927.00 | 5,194,817.71 |
| 3 | කාබනික ගොවිපල සංවර්ධනය | කාබනික | 100 | 0.1 | 76% | 76,000.00 | | |
| 4 | ඉඩම් ඵලදායිතාවය හා භෝග විවිධාංගීකරණය | ගොවි පවුල් | 4,500 | 6.0 | 90% | 5,451,929.00 | | |
| 5 | ආයතනික සංවර්ධනය | | | 4.0 | 92% | 3,728,194.88 | | |
| එකතුව | | | **4,634** | **100** | | **60,954,161.08** | **21,557,634.00** | **5,194,817.71** |

*වගු අංක - 09*

### 3.2.7. ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය - 2017

රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම අරමුණු කර ගනිමින් එම වැඩසටහනට සමගාමී ව ගොවි ප්‍රජාව දැනුවත් කිරීම තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා මධ්‍යකාලීන, කෙටිකාලීන හා ස්ථිර භෝග වගාවට අවශ්‍ය පැල ලක්ෂයක් රෝපනය කිරීමේ වැඩසටහන 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව එම පැල ගොවීන් වෙත ලබා දී රෝපනය කිරීමට කටයුතු සංවිධානය කර ඇත.

**ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයට සමගාමී ව රෝපණය කරන ලද පැළ**

| අනු අංක | බෝග වර්ගය | නිකුත්කළ පැල අවශ්‍යතාව |
|---|---|---|
| 1 | ගම්මිරිස් | 55393 |
| 2 | පොල් | 4419 |
| 3 | බද්ධ ජමනාරං | 4588 |
| 4 | බීජ දෙළුම් | 3825 |
| 5 | බද්ධ රඹුටන් | 1647 |
| 6 | බද්ධ දූරියන් | 1250 |
| 7 | බද්ධ බෙලි | 250 |
| 8 | බද්ධ දොඩම් | 1547 |
| 9 | බද්ධ අලිපේර | 650 |
| 10 | බද්ධ අඹ | 2088 |
| 11 | පැණි දොඩම් | 89 |
| 12 | බද්ධ වරකා | 500 |
| 13 | තැඹිලි (දේශීය) | 500 |
| 14 | නෙල්ලි පැල | 100 |
| 15 | නයි මිරිස් පැල බඳුන් | 500 |
| 16 | බීජ දෙහි | 3842 |
| 17 | එළවලු පැල | 22866 |
| 18 | විසිතුරු | 757 |
| 19 | බීජ පැල | 6989 |
| **එකතුව** | | **111,800** |

*වගු අංක - 10*



ගරු අමාත්‍යතුමා විසින් පැල බෙදා දීම



භෝග වගා වැඩසටහන - දෙල්තොට
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



ලග්ගල අතිරේක ආහාර භෝග වගා වැඩසටහන